## සංක්ෂිප්තය


නිල්වලා නිම්නය ආශ්‍රිතව ඇති ඇතැම් ඉඩම් වගා නොකිරීමට හේතු වී ඇති කරුණු හඳුනා ගනිමින්, එම ඉඩම් ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා ඵලදායීව යොදා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග හඳුනා ගැනීම මෙම කෙටි අධ්‍යයනයේ අරමුණ විය.

වර්තමානයේ නිල්වලා නිම්නය ආශ්‍රිතව පවතින ප්‍රධාන ගැටලුකාරී තත්ත්වයක් ලෙස කුඹුරු ඉඩම් පුරන්ව පැවතීම, දුර්වල ජලවහනය හා ඉඩම් නිරන්තරයෙන් ජලයෙන් යට වීම, ඇතැම් ඉඩම්වල අධික ආම්ලිකතාවයක් පැවතීම සහ ඇළමාර්ග ඔස්සේ කරදිය රට තුළට පැමිණීම නිසා පාංශු ලවණතාවය ඉහළ යාම හඳුනා ගත හැකි විය. උක්ත තත්ත්වයන් ඇති වීමටත් ඒ හරහා ඇතැම් ඉඩම් වගා කළ නොහැකි තත්ත්වයට පත් වීමටත් බලපාන මූලික හේතු ලෙස ජල කළමනාකරණය දුර්වල වීම, අහිතකර පාංශු සහ පාරිසරික සාධක, ප්‍රජාවගේ සමාජ ආර්ථික සාධක සහ ආයතනිකමය සහයෝගය ප්‍රමාණවත් නොවීම වැනි සාධක අනාවරණය විය. තවද සත්ව පාලනය ප්‍රචලිත කිරීම සඳහා ප්‍රදේශය ආශ්‍රිතව ඉහළ විභවයක් පවතින බවත්, එසේ වුව ද විශේෂයෙන්ම ගවයින් සඳහා අවශ්‍ය තණකොළ සපයා ගැනීමේ දී පවතින දුෂ්කරතා සහ පොදුවේ සියලු සත්ව නිෂ්පාදන සඳහා ඉහළ මිලක් නොලැබීම වැනි හේතු මත මෙම ප්‍රදේශයේ සත්ව පාලනය ව්‍යාප්ත වීම සඳහා බාධා වී ඇති බව ද අනාවරණය විය.

මෙම තත්ත්වයන් මඟහරවා ගනිමින් වගා නොකරන ඉඩම්වල නැවත වගාවන් ආරම්භ කිරීම සඳහා ජල කළමනාකරණය විධිමත් කිරීමත්, අහිතකර පාරිසරික සාධකයන්ට ඔරොත්තු දිය හැකි නව ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම සහ එම සාධකයන්ට ඔරොත්තු දිය හැකි ප්‍රභේද වර්ග තෝරා ගැනීමත් සිදු කළ යුතු බව යෝජනා කෙරේ. එසේම ඊට සමගාමීව වී වගා කළ නොහැකි ඉඩම් තුළ ප්‍රදේශයේ පාංශු හා පාරිසරික සාධකවලට හොඳින් අනුගත වෙමින් වැඩි අස්වැන්නක් ලබා දිය හැකි විකල්ප බෝග (කුරුඳු, පොල් වැනි ආර්ථික බෝග; වගුරු ආශ්‍රිතව පන් සහ ජලජ මල් වර්ග; ගොඩ ඉඩම් තුළ මුං, කව්පි වැනි කෙටි කාලීන බෝග) සහ එවැනි අහිතකර සාධක මඟහරවා ගත හැකි “සෝජාන්” (sorjan) වැනි වගා ක්‍රම/තාක්ෂණික ක්‍රම ප්‍රචලිත කළ යුතු බව ද යෝජනා කෙරේ.

එපමණකුදු නොව ආම්ලික පාංශු තත්ත්වයන්ට ඔරොත්තු දිය හැකි තණකොළ ප්‍රභේදයන් හඳුන්වා දීමත්, තණකොළ වගාව සඳහා අතිරේක ඉඩම් යොදා ගැනීමටත්, කෘෂි නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබා ගත හැකි වන ලෙස අගය එකතු කළ නිෂ්පාදන සඳහා ජනතාව පෙළඹවීමටත් කටයුතු කළ යුතු බව මෙම අධ්‍යයනය තුළින් යෝජනා කෙරේ.